# කතිරයේ බලය
# புள்ளடியின் பலம்

ISSN-2706-0047

9 772706 004002

වෙළුම 6 කලාපය 1 මැතිවරණ කොමිෂන් සභාව ජනවාරි-අප්‍රේල් 2022




# ඡන්ද හිමියන්ගේ දින ජාතික සැමරුම් උත්සවය 2022

## "ඔබේ ඡන්දය රටේ අනාගතයයි"

මැතිවරණ දෙපාර්තමේන්තුව 2012 වර්ෂයේ සිට සහ 2016 වර්ෂයේ සිට මැතිවරණ කොමිෂන් සභාව විසින් සෑම වසරකම ජුනි 01 වන දා ඡන්ද හිමියන්ගේ දිනය ලෙස නම්කොට ප්‍රජාතන්ත්‍රවාදය, සර්වජන ඡන්ද බලය, පරමාධිපත්‍ය හා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමේ ඇති වැදගත්කම අලළා විවිධ වූ සැමරුම් උත්සව හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් මුළු දිවයිනම ආවරණය වන පරිදි පැවැත්වීමට කටයුතු කොට ඇත. දේශන, පාගමන්, රථ පෙළපාලි, මහජන හමු, අත් පත්‍රිකා බෙදීම්, වීදි නාට්‍ය, චිත්‍ර/ කථික තරග ආදී විවිධ වූ අංගවලින් මෙම සැමරුම් උත්සව සංගෘහිත විය.

2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සම්මත වීමෙන් අනතුරුව ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලබන දිනය වශයෙන් එතෙක් පැවති ජුනි 01 වන දිනය වෙනුවට පෙබරවාරි 01 දින ලෙස නියම කරනු ලැබ ඇත. ඒ අනුව 2022 වර්ෂයේ සිට එම දිනය "ඡන්ද හිමියන්ගේ දිනය" ලෙස මැතිවරණ කොමිෂන් සභාව ප්‍රකාශයට පත් කරන ලදී.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධන පනත 2022 වර්ෂයේ පෙබරවාරි මස 01 දින සිට බලාත්මක වූ අතර, ඡන්ද හිමි ලියාපදිංචිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා විවිධ වූ වැඩසටහන් ලංකාව පුරා ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිෂන් සභාව පියවර ගන්නා ලදී. මෙවර ඡන්ද හිමියන්ගේ දින සැමරුම් ජාතික උත්සවය 2022.03.11 දින අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා, මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරන ලද විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සභාපති ගරු සභානායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, දේශපාලන පක්ෂ ලේකම්වරු, විදේශීය තානාපති/ මහ කොමසාරිස්වරුන්, රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ පාර්ශ්වකාර කණ්ඩායම්වල සහභාගීත්වයෙන් කොළඹ ගලධාරී හෝටලයේ දී පවත්වන ලදී.

මෙම උත්සව සභාවේ දී පැමිණි සියලුම ආරාධිතයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් පිළිගැනීම මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා විසින් සිදුකළ අතර, **"ඡන්ද අයිතිය සහ තරුණ ප්‍රජාවගේ වගකීම්"** මැයෙන් වූ උත්සවයේ මුඛ්‍ය දේශනය රුහුණු විශ්වවිද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මැතිතුමා විසින් පවත්වන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති නිමල් ජී. පුංචිහේවා මැතිතුමා අදහස් දක්වමින් ඡන්දයෙන් පත්වන ආණ්ඩුවල වැරදි ඇතොත් ඒවා විවේචනාත්මකව පෙන්වා දීමෙන් ඡන්දදායකයාට වගකීම් සහගත පුරවැසියෙකු විය හැකි බවත්, මහජන නියෝජිතයන් නොමැතිව මහජන ආයතන පවත්වාගෙන යාම මෙන්ම කලට වේලාවට මැතිවරණ නොපැවැත්වීම හා මැතිවරණ කල් දැමීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ එකඟත්වයක් නොමැති බවත්, මහජන නියෝජිතයන්ගේ නියෝජන වගකීම නිසිලෙස ඉටු නොකරන විට නැවත කැඳවීමේ හැකියාවක් තිබීම අවශ්‍ය බවත්, ප්‍රකාශ කළ අතර, සියලු අපේක්ෂකයන්ට සම අවස්ථා ලැබෙන පරිදි මැතිවරණ කාල සීමාවල දී කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන මාධ්‍ය උපමාන ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය මාධ්‍ය පමණක් නොව පෞද්ගලික හා සමාජ මාධ්‍ය ද කටයුතු කළ යුතු බව ද ප්‍රකාශ කරන ලදී. එසේම මැතිවරණ අණ පනත්වල පවත්නා තාක්ෂණික ගැටලු නිරාකරණය කරගැනීම මෙන්ම වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා කාන්තා, තරුණ නියෝජනය ස්ථාපිත කිරීම ඇතුළු අවශ්‍යව පවතින මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාවක් පත් කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ රජයට කොමිෂන් සභාවේ ස්තුතිය හිමිවන බවත්, එකී තේරීම් කාරක සභාව සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ පුළුල් කිරීමේ හැරවුම් ලක්ෂයක් ලෙස කොමිෂන් සභාව සලකනු ලබන බවත් ඒවා ක්‍රියාත්මක කිරීමට සියලු දේශපාලන පක්ෂ කටයුතු කරනු ඇති බවට විශ්වාසයක් පළ කරමින් එකී යෝජනාවල සාරාංශයක් ද සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අදහස් දක්වමින් ආසියාතික රාජ්‍යයන් අතුරින් ප්‍රථමවරට සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකාව, ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් අත්කරගෙන ඇති බවත්, ඒ වෙනුවෙන් ජනතාව උද්යෝගීමත්ව ඡන්දය ප්‍රකාශ කිරීමට පෙළ ගැසෙන බවත් ප්‍රකාශ කරන ලදී. නිසි පරිදි ඡන්ද විමසීම් පැවැත්වීම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික කාරණාවක් වන බවත්, ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා

පිළිවෙත පිළිබඳ බොහෝ දෙනෙකුට ඇති දැනුම අල්ප බවත්, ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කිරීම ඡන්ද හිමියන්ගේ දින සැමරුමෙන් අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම උත්සවය ඇමතූ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු සභානායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අදහස් දක්වමින් ඡන්ද විමසීම් නීති ප්‍රතිසංස්කරණය සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ලබාදෙන වැදගත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විශාල කාලයක් ගතවීම, ඒ සඳහා පත් කළ සියලු කාරක සභා අඛණ්ඩව මුහුණ දුන් බරපතල ගැටලුවක් බවත්, මීට පෙර ඉදිරිපත් වූ, අවුරුදු 18 සම්පූර්ණ වූ විගස ඡන්ද අයිතිය ලබාදීම, ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීම කේවල හා සමානුපාතික, මිශ්‍ර ඡන්ද ක්‍රමය ආදී යෝජනා මීට උදාහරණ කිහිපයක් බවත් ප්‍රකාශ කරන ලදී. තවද ජනතාවට ඡන්ද අයිතිය ලබාදුන්න ද, නියමිත කාලයෙන් ඔබ්බට ඡන්දය කල් දමන්නේ නම්, එය බරපතල ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක් බව ද, ප්‍රජාවේ විශ්වාසය තහවුරු කර, ඡන්ද විමසීමෙන් පසුවත් ජනතාවට, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට සහභාගි වීමේ ක්‍රම අවශ්‍ය බව ද, ඡන්ද හිමියන්ගේ දින ජාතික සැමරුම පැවැත්වීම සහ ඡන්ද ක්‍රම ප්‍රතිසංස්කරණයට දක්වන උනන්දුව සම්බන්ධයෙන් සභාපතිතුමා ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවට සිය කෘතඥතාව හිමිවන බව ද ප්‍රකාශ කළේ ය.

පොදු පාඨකයාට මෙන්ම පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා මැතිවරණ පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජනයක් අත්වේය යන අපේක්ෂාවෙන් මෙම ජාතික උත්සවය හා සමගාමීව පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව සාකච්ඡා කෙරෙන විද්වතුන්ගේ ලිපි ඇතුළත් "2022 ඡන්ද හිමියන්ගේ දින ජාතික සැමරුම් උත්සවය - ලිපි සංග්‍රහය" මැයෙන් වූ ශාස්ත්‍රීය සංග්‍රහයක් ද එළිදක්වන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු දේශපාලන පක්ෂ නියෝජිතයන්, රාජ්‍ය තාන්ත්‍රිකයන්, රාජ්‍ය නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන්, මාධ්‍යවේදීන්, කාන්තා, තරුණ, ආබාධිත ජනකොටස් නියෝජිතයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් සාර්ථක ලෙස සංවිධානය කොට මෙම උත්සවය පවත්වන ලදී.



# ඡන්ද බලය හා ඡන්ද හිමියන්ගේ දිනය




**නලින් සේමගේ**
*සහාපති සම්බන්ධිකරණ ලේකම් - මැතිවරණ කොමිෂන් සභාව*

ඡන්ද බලය 1931 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ එමෙන්ම සර්වජන ඡන්ද බලය ආසියාවෙන්ම පළමුව ක්‍රියාත්මක රට ශ්‍රී ලංකාව බැවින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සම්බන්ධයෙන් අප රටට සුවිශේෂී ස්ථානයක් හිමිව තිබේ. මැතිවරණයක් ප්‍රකාශයට පත් වූ විගස අප රටේ ජනතාව ඉතා උද්යෝගීමත්ව ඡන්දය ප්‍රකාශ කිරීමට සූදානම් වන බව පූර්ව අත්දැකීම් අනුව ප්‍රකට කරුණකි. එහෙත් ඡන්ද විමසීමට අදාළ වලංගු ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත්ව නොතිබීම හේතුවෙන් සැලකිය යුතු පිරිසකට ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකිවීම හේතුවෙන් කණස්සල්ලට පත්වන අවස්ථා ද වාර්තා වී තිබේ.

මැතිවරණයක දී නැතහොත් ඡන්ද විමසීමක දී ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ලබා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුම්වත්භාවය මද බව හා ඒ පිළිබඳව දක්වන උනන්දුව ඉතා අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචිය සඳහා සුදුසුකම් ඇති පුරවැසියන් යම් ප්‍රමාණයකගේ නම් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් නොවන බව ද නිරීක්ෂණය වේ.

ඡන්ද හිමියන් ලියාපදිංචිය පිළිබඳ නීතිමය කරුණු ඇතුළත් වන පනත 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතයි. එම පනත 2021 අංක 22 දරන සංශෝධිත පනතෙන් සංශෝධනය කරනු ලැබූ අතර, 2022 පෙබරවාරි 01 දින සිට එහි විධිවිධාන ක්‍රියාත්මක වේ.

ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ නිශ්චිත සුදුසුකම් හා නුසුදුසුකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන අතර, එම කරුණු තීරණය කිරීම සඳහා වූ නිශ්චිත දිනය, වයස හා පදිංචිය ද මෙම පනතේ ද සඳහන් වේ. එම දිනය වන විට අටළොස්විය (18) සම්පූර්ණ වූ තැනැත්තන් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචිය සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති අය ලෙස සැලකේ. 2021 අංක 22 දරන සංශෝධනයට පෙර මෙම දිනය අදාළ වර්ෂයේ ජුනි 01 ලෙස සලකනු ලැබූ අතර, මෙම සංශෝධනය අනුව ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන දිනය පෙබරවාරි 01 ලෙස සලකනු ලැබේ. ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලබන දිනය මැතිවරණ කොමිෂන් සභාව විසින් "ඡන්ද හිමියන්ගේ දිනය" ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ සිට පෙබරවාරි 01 "ඡන්ද හිමියන්ගේ දිනය" ලෙස සලකනු ලැබේ.

සුදුසුකම්ලත් සියලුදෙනා ඇතුළත් ඡන්ද විමසීම් ක්‍රියාවලියක් යන සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා ඡන්ද හිමියන්ගේ දිනයක් නම් කිරීම වැදගත් වේ. සුදුසුකම් ඇති සියලු පුරවැසියන්ට ඡන්ද අයිතිය ලබාදිය යුතු බව ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු රටවල් පිළිගන්නා කරුණකි.

වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කරමින් හැකි උපරිම අයුරින් සියලුදෙනා ඇතුළත් ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කරන සීමිත වූ රටවල් අතර, ශ්‍රී ලංකාව කැපී පෙනේ. එමෙන්ම රටේ මූලික නීතිය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන ව්‍යවස්ථාව අනුව ජනරජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇති බවත්, එය අත්හල නොහැකි බවත් සඳහන් වන අතර, "පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ඇතුළත් වන්නේය" යනුවෙන් දක්වා තිබීම මත ඡන්ද හිමියකු වීමෙන් ඡන්ද බලය ලබා ගැනීමේ වැදගත්කම එයින් පැහැදිලි වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන ව්‍යවස්ථාවේ සඳහන් පාලන බලතලවලට විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණ බලතල අයත් වේ. විධායකය හා ව්‍යවස්ථාදායකය සඳහා නියෝජිතයන් ඡන්ද විමසීම් මඟින් තෝරා පත්කර ගනු ලබන බැවින් මෙම පාලන බලතල ඡන්ද බලය මත තීරණය වන බවත්, ඒ මත රඳා පවතින බවත් ගම්‍ය වේ. මූලික අයිතිවාසිකම් හැරුණු විට පරමාධිපත්‍යය යටතට ගැනෙන අනෙකුත් කරුණු මහජනතාවගේ ඡන්ද බලය මත තීරණය වන බව ඉතා පැහැදිලිය. එනයින් බලන කළ ඡන්ද හිමි නාමලේඛනය රටේ ඉතා වැදගත් ලේඛනයක් ලෙස හඳුන්වා දීමට හැකිය.

වයස අවුරුදු 18 සම්පූර්ණ වූ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ඡන්ද බලය හිමිය. ඒ සඳහා සපුරාලිය යුතු කොන්දේසි කීපයක් ඇත. එනම්, ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ස්ථානයේ සාමාන්‍ය පදිංචිය ඇති අයකු වීම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව ඇති නුසුදුසුකම්වලට යටත් නොවන අයෙකු විය යුතු ය.

1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ පනත අනුව යම් වර්ෂයක සුදුසුකම් ලැබීමේ දිනයට පසුව උපත ලැබූ අයකුට අටළොස්විය සම්පූර්ණ වූව ද එළඹෙන වසරේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය කරන තෙක් ස්වකීය නම ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර ගැනීමට නොහැකි විය. ඒ අනුව එම කාලසීමාවේ දී ඡන්ද විමසීමක් පැවැත්වුවහොත් වයස 18 සම්පූර්ණ වූව ද ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත්ව නොතිබීම මත තරුණ ප්‍රජාවෙන් යම් කොටසකට යම් ඡන්ද විමසීමක දී ඡන්ද බලය අහිමි වූ අවස්ථා තිබුණි. මෙම ගැටලුකාරී මෙන්ම සීමාකාරී තත්ත්වයට සාධනීය විසඳුමක් 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතින් හඳුන්වා දීම ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් තහවුරු කිරීමට ගන්නා ලද විශිෂ්ට පියවරක් ලෙස හඳුන්වා දීමට පිළිවන. 2021 අංක 22 දරන සංශෝධන පනත මගින් සුදුසුකම් ලබන දිනයෙන් පසුව ඒ ඒ කාලවකවානුවල දී පරිපූරක ඡන්ද හිමි නාමලේඛන තුනක් (3) සකස් කර සහතික කිරීමෙන් පසුව එම පරිපූරක නාමලේඛන ප්‍රධාන ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීමට හැකි වන පරිදි විධිවිධාන සලසා ඇත.

ඡන්ද හිමියන්ගේ දිනය සැමරීම සඳහා පැවැත්වෙන විවිධ උත්සව හා වැඩසටහන්වල දී, ඡන්ද හිමි නාමලේඛනයට නම් ඇතුළත් නොවන බව මේ වන විට හඳුනාගෙන ඇති ආන්තික කොටස් ඒ පිළිබඳව දැනුම්වත් කිරීම, ඡන්ද හිමියන් ලියාපදිංචි නීතිය පිළිබඳ පුරවැසියන් හා නිලධාරීන් දැනුම්වත් කිරීම, පරිපූරක ඡන්ද හිමි නාමලේඛනය පිළිබඳව තරුණ ප්‍රජාව දැනුම්වත් කිරීම, ඡන්ද හිමියන් ලියාපදිංචිය කෙරෙහි දේශපාලන පක්ෂ නියෝජිතයන්ගේ උනන්දුව ඇති කිරීම හා අවධානය ලබා ගැනීම කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාව අවධානය යොමු කර කටයුතු කිරීම යහපත් ප්‍රවණතාවකි.

ඡන්ද හිමියන් ලියාපදිංචියේ දී නව තාක්ෂණය ද උපයෝගී කර ගනිමින් සුදුසුකම්ලත් සියලු පුරවැසියන්ගෙන් උපරිම සංඛ්‍යාවක් ඇතුළත් ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කිරීම සඳහා වූ මැතිවරණ කොමිෂන් සභාවේ ව්‍යායාමය යථාර්තයක් කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අදාළ සියලුම පාර්ශ්වයන්ගේ සහය ලබා දීම අත්‍යාවශ්‍ය වේ.

# 2022 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය





**ශ්‍රීන් යාපා බොරලැස්ස**
සහකාර මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)


## 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධන ක්‍රියාවලිය

පූර්ව වර්ෂවල දී ජුනි මස 01 දින සිට ඡන්දහිමියන් ගණන් ගැනීම ආරම්භ වුව ද 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මඟින් ඡන්දහිමියන් ගණන් ගැනීමේ දිනය පෙබරවාරි 01 ලෙස සංශෝධනය විය. ඒ අනුව 2022 පෙබරවාරි 01 දින සිට ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු ආරම්භ විය.

සාමාන්‍යයෙන් පූර්ව ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවල දී සෑම ගෘහයකටම ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතියක් (BC ආකෘතිය) බෙදා දී සංගණනයක් සිදුකරනු ලැබුවත්, රට තුළ වර්තමානයේ පවතින COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් පුරවැසියන්ගේ හා නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිණිස 2021 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී සිදුකළ ආකාරයට ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ආකෘති බෙදාදීමක් සිදු නොකිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදි. ඒ වෙනුවට 2021 ඡන්දහිමි නාමලේඛනයෙන් ඉවත්වන හා අලුතින් ඇතුළත්වන නම් ඇසුරින් පමණක් ඡන්දහිමියන් ගණන් ගැනීම ප්‍රතිශෝධනය සඳහා 2022/ER නැමැති විශේෂ ආකෘතිය හඳුන්වා දී ඇත.

ඒ අනුව 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීමේ කටයුතු මතු දැක්වෙන ආකාරයට සිදු කෙරේ.

- දිවයින තුළ පවතින COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂයේ දී ද, 2021 වර්ෂයේ මෙන්ම සෑම නිවසකටම ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතිය (BC) පත්‍ර බෙදාදීමක් සිදු නොකරන බැවින් 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ  ලියාපදිංචි වී තිබේදැයි යන්න www.elections.gov.lk වෙබ් අඩවියෙන් හෝ ග්‍රාම නිලධාරී කාර්යාලයෙන් පරීක්ෂා කර බැලීම කළ යුතු වේ.
- 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කොට තිබේ නම් සහ 2022 පෙබරවාරි 01 දින වනවිට පදිංචිය වෙනස් වී නොමැති නම් කිසිදු අයදුම්පත්‍රයක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය නොවේ. ඒ අනුව 2021 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ලිපිනයේ ම 2022 වර්ෂය සඳහා ද ලියාපදිංචි කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ.

## පදිංචිය වෙනස් වීම හේතුකොටගෙන නව ලියාපදිංචිය සම්බන්ධයෙන් ක්‍රියා කළයුතු ආකාරය.

සාමාන්‍ය පදිංචිය 2022 පෙබරවාරි මස 01 දිනට පෙර වෙනස් වී තිබේ නම් පමණක් 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ නව ලිපිනය යටතේ ලියාපදිංචි වීමට අවකාශය සලසා දී තිබේ. ඒ සඳහා දැනට පදිංචි වී සිටින ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා හමු වී 2022/ER ආකෘති පත්‍රයක් ලබාගෙන එය සම්පූර්ණ කර භාරදිය යුතු වේ. මෙම ආකෘතිය www.elections.gov.lk වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකිය. මෙම ආකෘතියේ පූර්ව ලියාපදිංචි විස්තර සඳහන් කිරීමට ඇති තීරුවෙහි එම විස්තර අනිවාර්යයෙන් සටහන් කිරීම කළ යුතු වේ. එසේම පූර්ව පදිංචි ස්ථානයෙන් පදිංචිය හැරයාමට අදාළව ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරන ලද ලිපිය ඉදිරිපත් කිරීම අනිවාර්යය නොවේ.

## 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැත්තේ නම් එම තැනැත්තන් 2022 වර්ෂයේ දී ඡන්දහිමියෙක් වශයෙන් ලියාපදිංචි විය යුතු ආකාරය.

2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් වර්තමානයේ සාමාන්‍ය පදිංචිය දරන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා හමු වී 2022/ER ආකෘතියක් ලබාගැනීම හෝ මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.gov.lk වෙබ් අඩවියෙන් බාගත කොට එම ආකෘතිය නියමිත පරිදි සම්පූර්ණ කොට ග්‍රාම නිලධාරී වෙත භාරදිය යුතු වේ. මෙම ආකෘතියෙහි අවසන්වරට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටි ලිපිනයෙහි විස්තර සටහන් කිරීමට වගබලා ගත යුතු වේ.

## 2022 වර්ෂයේ දී වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම.

2004.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ට 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව පවතී. ඒ අනුව මෙම වර්ෂයේ දී 18 සම්පූර්ණ වන තැනැත්තන් 2022/ER ආකෘතියක් සම්පූර්ණ කොට උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ග්‍රාම නිලධාරීවරයා වෙත භාරදිය යුතු වේ.

## මාර්ගගතව ලියාපදිංචි කිරීමේ පහසුකම

එමෙන්ම ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට මාර්ගගත (Online) පහසුකම ද මේ වනවිට ලබාදී ඇති අතර ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිස (www.elections.gov.lk) එහි සඳහන් කොට ඇති උපදෙස් පරිදි ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමට පුළුවන.

11 වන පිටුවට...




# සිනමාව, ජනමත සැකසුම හා ලෝක දේශපාලනය

එච්.ඒ.ගයාන් මධුශංඛ
කථිකාචාර්ය - චිත්‍රපට සහ රූපවාහිනි නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයන අංශය
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

කොවිඩ් 19 වසංගත තත්වය චිත්‍රපට සිනමා ශාලාවෙන් අන්තර්ජාලයට ගෙන ගොස් ඇත. මේ තත්වය හේතුවෙන් වඩාත් වැඩි ප්‍රේක්ෂකාගාරයක් වෙත ඉතා ඉක්මනින් සිනමාව ගෙන යාමට හැකියාව ලැබී ඇත. ඉන් ඇතිකරනු ලබන බලපෑම ද එසේම වේගවත් බව පෙන්වා දීමට පිළිවන. අන්තර්ජාල භාවිතාව මඟින් චිත්‍රපට නැරඹීමට හැකිවීම හේතුවෙන් වැඩි ප්‍රේෂක පිරිසකට චිත්‍රපට නැරඹීමේ හැකියාව ලැබී තිබේ. "The Family Man" චිත්‍රපට කථා මාලාවේ දෙවන කථා මාලාව ජුනි මාසයේ 04 වන දින ප්‍රේක්ෂකයා වෙතට පැමිණෙන්නේ ඇමසන් ප්‍රයිම් වීඩියෝ වෙබ් අඩවිය හරහා නැරඹිය හැකි චිත්‍රපටයක් ලෙසයි. මෙම වෙබ් කතා මාලාවේ පළමු කථාංගය ද බොහෝ ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනාගන්නා ලදී. ඇක්ෂන්, කොමඩි, ඩ්‍රාමා ශානරවලට අයත් මෙම ටෙලි කථා මාලාවේ දෙවැනි කථාංග මේ වන විටත් බොහෝ ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනාගෙන ඇත. මෙම ටෙලි කථා මාලාවේ ශ්‍රී ලාංකික අපට ඇති සම්පත්වය වන්නේ එහි මුඛ්‍ය කොටස් ලංකාව සමග සෘජු සම්බන්ධතාවක් ගෙන තිබීමයි. ඉන්දියාව ශ්‍රී ලංකාව අතර පවතින දේශපාලන සම්බන්ධය සහ එල්.ටී.ටී.ඊ සංවිධානය සම්බන්ධ සිදුවීම් මෙම චිත්‍රපටයට පාදක වී ඇත.

සිනමාව රසවින්දන මාධ්‍යයක් මෙන්ම ජනමතය සකස් කරනු ලබන මාධ්‍යයක් ලෙස ද පෙන්වා දීමට පිළිවන. ඉන්දියාව සිය ප්‍රචාරණ කටයුතු සඳහා සිනමාව සෘජුවම භාවිතයට ගෙන ඇති අතර එම ක්‍රමවේදය ඉතාම හොඳින් වටහාගත් රාජ්‍යය වන්නේ ද ඉන්දියාවයි. ඉන්දියාව චිත්‍රපට මඟින් බොහෝ සංදේශ නිකුත් කරනවා මෙන්ම සිය රටවැසියන්ගේ මතය වෙනස් කිරීම කෙරෙහි ද සිනමා ක්ෂේත්‍රය භාවිතා කරයි. මේ සියල්ලට වඩා කර්මාන්තයක් වශයෙන් සිනමාව ආදායම් උත්පාදනය කරනු ලබන ක්ෂේත්‍රයක් වශයෙන් ඉන්දියාවට වැදගත් වේ. එසේ වුව ද ඉන්දියාව විසින් ආදායම් උත්පාදක මෙවලමකට අමතරව සිනමාවෙන් ලබා ගන්නා ප්‍රයෝජන බොහොමයකි. ඉතිහාසය පුරා සිදුවූ සිදුවීම් ඊට සාක්ෂි දරයි. ආදායම් උත්පාදක කර්මාන්තයකට ඔබ්බෙන් වූ ජනමත සැකසුම් මාධ්‍යයක් ලෙස ද සිනමාව හැඳින්විය හැකි ය. මෙම ලිපියට පාදක වන චිත්‍රපටය කොතරම් ජනමත සැකසුමකට බලපෑමක් කරයි ද යන්න විමසීම වැදගත් වේ. "The Family Man" ටෙලි කතා මාලාව ශ්‍රී ලංකාවේ දේශපාලනික සන්දර්භය සෘජුවම සාකච්ඡාවට භාජනය කරනු ලබයි. ශ්‍රී ලංකාව සහ චීනය අතර පවතින ආර්ථික දේශපාලනික සම්බන්ධය කෙරෙහි ඉන්දියාවේ නිරීක්ෂණය මෙම චිත්‍රපටයේ දී සාකච්ඡාවට බඳුන් කෙරේ. එසේම එල්.ටී.ටී.ඊ සංවිධානය සහ එහි ක්‍රියාකාරිත්වය ද මෙම චිත්‍රපටය තුළින් සෘජුවම කතාබහට ලක්කරයි. දර්ශන තල ලෙස ශ්‍රී ලංකාවේ ඇතැම් කොටස් සිනමාත්මකව නිරූපණය කරන අතර සිංහල භාෂාවෙන් ද දෙබස් හැසිරවීම් දක්නට ලැබෙයි. එමගින් ඇති කරනු ලබන බලපෑම කෙබඳු ද යන්න ද විමසා බැලිය යුතු ම ය. චිත්‍රපටයක් යනු මනඃකල්පිත කතාවක් විය හැකි ය. එසේම මෙම චිත්‍රපට මාලාව ඉන්දියානු රජයේ කතාවක් නොවන අතර වෙබ් කතා මාලාවේ අධ්‍යක්ෂවරු සහ නිෂ්පාදකයන්ගේ කතාවක් විය හැකි ය. නමුත් එමගින් ඇතිකරන බලපෑම මනඃකල්පිත නොවේ. ඉන්දියාව මෙම සිනමා පටය මගින් ශ්‍රී ලාංකිකයන්ට යමක් පවසනවා ද? නැත්නම් යම් පණිවිඩයක් දෙනවා ද? යන්න ද දෙවනුව ස්මරණය කළ යුතුව පවතී. පූර්වයෙන් ඉන්දියාවේ සිනමා භාවිතය පිළිබඳ කෙටි අදහසක් ලබාගැනීම මෙම චිත්‍රපටය පිළිබඳ අවබෝධ කර ගැනීමට මග පාදනු ඇත.

ජාති ආගම් කුල සහ කළාප වශයෙන් බෙදුණු ඉන්දියානු ජනතාව හින්දුස්තානි ජාතිකත්වයට ගොනුකරලීමේ කාර්යය පාසල් මට්ටමෙන් සිදුවුණු අධ්‍යාපන ක්‍රියාවලියකට වඩා වේගවත්ව සිදුකළ හැකි වූයේ සිනමා මාධ්‍යයෙනි. බටහිර ආක්‍රමණිකයන් ගෙන් නිදහස ලබාගැනීමෙන් පසුව ඉන්දියානු සිනමාව ජාතිකත්වය වර්ධනය කිරීමේ අරමුණු කරගත් කථාමාලාවන් සහිත සිනමා නිර්මාණ බිහි කරන්නට විය. එය අදටත් එසේම පවතී. සිනමාව තුළින් රටට ආදරය කරන දේශප්‍රේමී ජනතාවක් බිහිකිරීමේ චින්තනමය ව්‍යායාමයක ඉන්දියාව නිරත විය. දේශානුරාගය, දේශප්‍රේමීත්වය ජනතාවගේ සිත් සතන් තුළට කාවැද්දීමට සිනමාව මාධ්‍ය කොට ගන්නා ලදී. 1947 ඉන්දියාව නිදහස ලබාග ැනීමෙන් පසු ජවහර්ලාල් නේරු දර්ශනය ඔස්සේ ජාතිකවාදී දර්ශනයක ගමන් කරන්නට විය. ඉන්දියානු සංස්කෘතිය, ආහාරපාන, ඇඳුම්පැළඳුම්, ආගම දහම වැනි කරුණු කෙරෙහි ජනතාවගේ අවධානය යොමු කිරීමටත් බටහිරකරණයෙන් ජනතාව ඈත්කොට හින්දුස්ථානි සංකල්පය වෙත ඉන්දියානුවා ගෙන ඒමටත් සිනමාව ප්‍රබල දායකත්වයක් දැක්විය. මේ හේතුවෙන් බටහිර රාජ්‍යයවලට ඉන්දියාවේ ආර්ථිකය ඩැහැගැනීම පහසු නොවිය. ලංකාවේ මෙම කාර්යය සිනමාවට වඩා පසුකාලීනව බිහි වූ "කවට කතිකයා", "කවට රජා", "දැනුමැති කවටයා" ආදී වූ කවට පුවත්පත් මගින් සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ බිහිවූ මුල්කාලීන පුවත්පත් මාධ්‍ය ද ආගමික දේශපාලනික මතවාද ජනතාව වෙත ගෙනයමින් ජනමත සැකසීමේ කාර්යයක නිරත විය. ඉන්දියාවේ තිබූ සිනමා කර්මාන්තයේ දියුණුව හේතුවෙන් එය වඩාත් වේගවත් විය. එසේම ජනතාවගේ සාක්ෂරතා ගැටළුවක් මතුනොවීම හේතුවෙන් ද සිනමාව ඊට උචිතම මාධ්‍යය විය.

ඉන්දියාවේ ජාතික සංවර්ධනය කෙරෙහි ද මහජනයා හැඩගස්වා ගැනීමේ කාර්යයට සිනමාව දායක විය. 1949 නේරු ආණ්ඩුව විසින් චිත්‍රපට විමර්ශන කමිටුවක් පත්කර ඇත. මේ අවධියේ

බිහි වූ චිත්‍රපට නව ඉන්දියානු ජාතිකත්වයක අපේක්ෂාව සහිත සමාජවාදී, යටත් විජිත විරෝධී සංදේශ බෙදාහරින්නට විය. නේරුවියන් සමාජවාදය මෙම චිත්‍රපටවල දර්ශනය විය. මෙම චිත්‍රපට ඉන්දියානු ප්‍රේක්ෂකාගාරය ආකර්ෂණය කරගත් සේම චිත්‍රපටවල යටිපෙළ ඉන්දියානු ජනතාවගේ රුධිරය වෙත ගමන් කරන්නට විය.

1962 ඉන්දියාව සහ චීනය අතර ඇති වූ යුද්ධය දෙරට අතර අර්බුද රැසක් නිර්මාණය කරන්නට විය. 1950 දශකයේ ඉන්දු චීන මිත්‍රත්වය තහවුරු කිරීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වුව ද ඒවා ඵල රහිත විය. **ආවාරා (1951)** චිත්‍රපටය ඉන්දියානු චිත්‍රපටයක් වුව ද එය චීනයේ ජනතාව අතර අතිශය ජනාදරයට පත් චිත්‍රපටයක් විය. චීන භාෂාවෙන් Liulangzhe නමින් මෙම චිත්‍රපටය ජනප්‍රිය විය. ඉන්දු චීන අර්බුදය මැද සිනමාව දෙපාර්ශවයටම පොදු රසවින්දනයක් ගෙන එනු ලැබීය.

**1957 මදර් ඉන්දියා** චිත්‍රපටය ජාතිකත්වය මතු කිරීම සඳහා බිහිවී ඇති ජනතා ආකර්ෂණය ඉහළින් දිනාගත් චිත්‍රපටයක් වේ. එම චිත්‍රපටයේ ප්‍රධාන චරිතයක් වූ රාධා පොළොවේ පස් මිටක් ගෙන සිය නළලත වෙත ගෙන ඒම සහ වන්දේ මාතරම් යන සම්ප්‍රදායික වාදනයන් පසුබිමෙන් ඇසීමෙන් ම ආරම්භක දර්ශනයේ ජාතිකත්වය විදහා දැක්වෙන අන්තර්ගතයක් පවතින බව විද්‍යමාන වේ.

රාජ් කපූර්ගේ සිනමාව නිදහසෙන් පසු බිහිවෙන නව ඉන්දියාව වෙත ගමන් කරන තාරුණ්‍යය සකස් කිරීමට බෙහෙවින් දායක විය. **ශ්‍රී** 420 චිත්‍රපටයේ ගීත අතර මෙම ජාතිකවාදී සංකල්පය ගැබ්වී ඇත. දිල්හේ හින්දුස්ථානි එනම් හදවත හින්දුස්තානි ඉන්දියානු ගීත අතර ඇසෙන්නට විය. එය ජාතියක් ලෙස එක්ව නැගීමට අවශ්‍ය ජවය මනසට කාන්දු කරන්නට විය. කුල ගෝත්‍ර ජාති ආගම් කුමක් වුවත් ඒ සැමට වඩා රට ප්‍රමුඛ විය. එසේම මෑත කාලීනව අමීර් කාන් රංගනයෙන් දායක වූ චිත්‍රපට රැසක් ජාතිකවාදී දෘෂ්ටිකෝණයක සිට සකස් වූ චිත්‍රපට ලෙස පෙන්වා දිය හැකිය. **සර්ෆරොෂ් (1999), ලගාන් (2001), මංගල් පාන්ඩේ (2005), ෆනා (2006)** නිදසුන් කිහිපයක් පමණි. මෑත ඉතිහාසය තුළ නරේන්ද්‍ර මෝදි බලය ලබා ගැනීම සහ ආණ්ඩු පිහිටුවීමට අවශ්‍ය ජනමතය සකස් කිරීම සඳහා ද පසුබිම් වූ චිත්‍රපට ගණනාවක් ඇත. එම චිත්‍රපටවල කතා සන්දර්භය නරේන්ද්‍ර මෝදි ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ දැක්මට සමපාතව ගමන් කරන්නක් විය. මැතිවරණ ව්‍යාපාරයට අවශ්‍ය පන්නරය සහ පසුබිම් සහය චිත්‍රපට මගින් සකස් කරන ලදී. එය වඩාත් වේගවත් වූ සේම සරල විය.

The Family Man චිත්‍රපටයේ කතාව කෙටියෙන් දැක්වුවහොත් මෙසේය. ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරිය ඝාතනය කිරීම සඳහා සිදුකරන මෙහෙයුමක් ඉන්දියාවේ බුද්ධි අංශ විසින් ව්‍යක්ත කරයි. මෙම ඝාතන සැලැස්ම සිදු කරන්නේ කොටි ත්‍රස්තවාදීන් විසිනි. මෙම ප්‍රධාන කතාන්දරය තුළ ඉන්දියාවේ රජයේ සේවකයෙකුගේ ගෘහස්ත තත්වය ද සාකච්ඡා කරයි. එසේම නාගරික පරිසරයක ජීවත්වන පවුල් සම්බන්ධය, දරුවන්ගෙන් ඈත් වන දෙමව්පිය සම්බන්ධය, ඉන්දියාවේ පැවති කුටුම්භ සංස්කෘතියේ වෙනස්වීම, දරුවන්ගේ ස්වභාවය සහ ඒ වටා ගොඩනැගෙන පරිසරය චිත්‍රපටය මගින් විග්‍රහ කෙරේ. එවිට ත්‍රාසය මෙන්ම හාස්‍යය ද නොඅඩුව ප්‍රේක්ෂකයා වෙත ලබා දී ඇත. ඒ තුළින් ප්‍රේක්ෂාගාරය මනාවට චිත්‍රපටයට ඇද බැඳතබා ගැනීමට හැකි වී තිබේ. සෑම මොහොතක්ම චිත්‍රපටයේ ඊළඟ මොහොත දැකගැනීමේ කුතුහලින් පුරවාලනු ලබයි.

චිත්‍රපටය ආරම්භයේ දී ඉන්දියානු අගමැතිනිය, ශ්‍රී ලංකාව සහ චීන රජය අතර පවතින සම්බන්ධතා පිළිබඳවත් ඉන් ඉන්දියාවට ඇතිකරනු ලබන පීඩනයත් පිළිබඳව සාකච්ඡා කෙරේ. චීන රජය ශ්‍රී ලංකාව තුළ සිදුකරන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ සෘජුව එහි සාකච්ඡාවට බඳුන් කර ඇත. එසේම ඉන්දියානු රජය විසින් චීනයට සමීප වූ ලංකාව නැවත ඉන්දියාවට සමීප කරවාගැනීමට දරන තැත චිත්‍රපටයේ විකාශ කෙරේ. ඊට ඉන්දියාවේ ඇති කැමැත්ත සහ අවශ්‍යතාව චිත්‍රපටයෙන් විද්‍යාමාන කරනු ලබයි. ලංකාවේ රාජ්‍ය නායකයින් චිත්‍රපටය තුළ වෙනස් නමකින් නිරූපිතය. චිත්‍රපටයේ ඉන්දියානු අග්‍රාමාත්‍ය චරිතය සඳහා සීමා හිශ්වාස් රංගනයෙන් දායකවේ. ලංකාවේ රාජ්‍ය නායකත්වය ලසිත් රූපතුංග නමින් අන්වර්ත නමකින් හඳුන්වන නමුත් ඇඳුම් ආයිත්තම් තුළින් මනා ලෙස ලංකාවේ රාජ්‍ය නායකත්වය විද්‍යමාන කරයි.

මෙම චිත්‍රපටයේ වැදගත්ම සහ අවධානය යොමුකළ යුතුම කොටසක් වන්නේ එල්.ටී.ටී.ඊ සංවිධානය සම්බන්ධ සිදුවීම් මාලාවයි. එල්.ටී.ටී.ඊ සංවිධානය ඕනෑම මොහොතක හිස ඔසවා විනාශයක් ඇතිකරනු ඇත යන පණිවිඩය මෙම චිත්‍රපටයෙන් ගෙන එයි. එසේම එය නැවැත්වීමේ හැකියාව සහ ශක්තිය ඉන්දියාව සතුවන බව චිත්‍රපටය පෙන්වා දෙයි. එසේ නොකළේ නම් ඔවුන් නැවත හිස ඔසවනවා ද යන පණිවිඩය චිත්‍රපටය තුළින් ගෙන එනවා ද යන්න සිතිය යුතුව පවතී. මෙය එක්තරා ආකාරයකට බිය ගැන්වීමක් ද යනුවෙන් ද සිතිය හැකි ය. එය මගේ පුද්ගලික අදහසයි.

මෙම ඉන්දියානු චිත්‍රපටය මගින් එල්.ටී.ටී.ඊ සංවිධානය පිළිබඳ යුද්ධයෙන් වසර දහයක වැඩි කාලයක් ගතව ඇති මොහොතේ එය නැවත සිහිපත් කරවීමක් වැන්න. යුද්ධය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සිනමාවට සාර්ථක කථා තේමාවන් වන අතර අදටත් පළමු හා දෙවන ලෝක යුද්ධ සම්බන්ධ චිත්‍රපට බිහි වීම ඊට නිදසුනක් වේ. නමුත් මෙම චිත්‍රපටයට පාදක වන්නේ වර්තමාන තත්වයකි. කොටි සංවිධානය විදේශීය රටවල සංවිධානය වන අයුරුත්, ඔවුන් ගිලිහි ඇති ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනගාගන්නා අයුරුත් ඉන් නිරූපණය කරයි. පෙර පැවති ආයුධ සන්නද්ධ අරගල ක්‍රමය වෙනුවට දේශපාලනික මුහුණුවරක් නිර්මාණය කර ගැනීම නව ආකෘතිය වී ඇති බවත් චිත්‍රපටය තුළින් විද්‍යාමාන කරයි. සංවිධානයේ නායකත්ව වෙනස එම අරමුණ වෙනුවෙන් ම සිදුව ඇත.

ආක්‍රමණශීලී යුධ මානසිකත්වයකින් යුතු පිරිස් ක්‍රමයෙන් සංවිධානයෙන් ඉවත් වන ආකාරයත් දේශපාලනික වශයෙන් සිදුකරන සටනකට සූදානම් වන අයුරුත් ඊට සංවිධානය තුළ ලැබෙන පිළිගැනීම සහ ඉඩකඩ චිත්‍රපටය මගින් ඉතාම සියුම්ව

ගෙනහැර දක්වා තිබේ. ඔවුන් ස්වකීය ඉලක්කය වෙනුවෙන් තවමත් සියුම්ව කටයුතු කරන බව එම දර්ශනවලින් හැඟේ.

යුද්ධයක් ඇතිවීම හෝ ඇති කිරීම සඳහා බොහෝ විට තෙවැනි පාර්ශ්ව කටයුතු කරන අවස්ථා ඇත. මෙම චිත්‍රපටයේ සුබ්බු නම් පුද්ගලයා ඝාතනය කිරීමේ අවස්ථාව එයට නිදර්ශකයක් වනු ඇත. සුබ්බුගේ ඝාතනය නැවත ආයුධ සන්නද්ධ ගැටුමක් ඇතිකිරීමට මාවත විවර කරයි. නමුත් එය ඇතිකරන්නේ තුන්වැනි පාර්ශ්වයක් විසින් ඔවුන්ගේ වුවමනාව පිණිස ගැටුමක් ඇතිකිරීමට ය. යුද්ධයක වාසිය ලබාගන්නා තුන්වන පාර්ශ්වය බොහෝවිට යුද ගැටුම් ඇතිකරයි. එසේ ගැටුම් ඇතිකොට ඔවුන්ගේ අභිමතාර්ථ ඒ මගින් ඉටුකර ගනිති. චිත්‍රපටයට අනුව ඉන්දියාවට හානි සිදුකිරීම අරමුණු කරගනිමින් මුස්ලිම් අන්තවාදී සංවිධාන මෙම ගැටුම ඇතිකරයි. ඊට කොටි ත්‍රස්තවාදීන් ද හවුල් කර ගනී.

චිත්‍රපටයේ මූලික අවධානය ඉන්දියාවේ අග්‍රාමාත්‍යවරිය ඝාතනය කිරීම සඳහා එල්.ටී.ටී.ඊ සංවිධානය සිදුකරන මෙහෙයුම වෙත යොමුවේ. ඉන් කුමන ආකාරයක සන්දේශයක් ලෝකය පුරා විසිරී සිටින එල්.ටී.ටී.ඊ සංවිධානයේ ක්‍රියාකරුවන්ට ලබාදෙන්නේ ද යන්න පිළිබඳ විමසිය යුතු ය. කොටි සංවිධානයේ සාමාජිකාවක් මෙම චිත්‍රපටයේ එක් කථානායිකාවකි. නමින් ඇය රාජි. ඇය යුද්ධය අවසන් වී ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට පලාගොස් රැකියාවක් කරමින් රහසේ ජීවත් වන්නියක් වේ. එවන් බොහෝ දෙනෙක් සත්‍ය වශයෙන්ම ඉන්දියාවේ ජීවත් වනු ඇත. ඇය වරක් සිදුවූ යම් සිදුවීමකට සියදිවි නසා ගැනීමට උත්සහ කරයි. ඒ මොහොතේ ඇයට දුරකථන ඇමතුමක් එයි. ඒ සිය සංවිධානයේ නායකතුමාගෙන් ආ පණිවිඩයකි. නව මෙහෙයුමකට ඇයට අණ ලබාදෙයි. මෙම දර්ශනයෙන් නිකුත් කරන යම් පණිවිඩයක් ඇත්ද? නිෂ්ක්‍රියව සිටින එල්.ටී.ටී.ඊ සාමාජිකයින්ට සිය අරමුණ වෙනුවෙන් සක්‍රිය වීමට ඕනෑම මොහොතක නායකතුමන්ගේ දුරකථන ඇමතුමක් පැමිණීම සිදුවිය හැකිය යන්න වේ. සංවිධානයේ මානසික තලය යුද්ධයක් හෝ ගැටුමක් වෙනුවෙන් එකම මාවතක තබා ගැනීමට චිත්‍රපටය උත්සහ කරන්නේ ද යන ගැටලුව මට ඇතිවිය. ස්වභාවිකව ජීවිතය නැතිවන තෙක් ඔවුන්ගේ අරමුණ වෙනුවෙන් නිහඬව සිටිය යුතුය යන සංදේශය ගෙන ඒමට එවැනි දර්ශන කිහිපයක්ම චිත්‍රපටය තුළ නිරූපණය කර ඇත. සංවිධානය ජාත්‍යන්තරය තුළ ඉතාම හොඳින් සංවිධානය වන බව චිත්‍රපටයෙන් ඒත්තු ගන්වයි. නිෂ්ක්‍රිය කොටි සාමාජිකයින්ට චිත්‍රපටය තුළින් අපේක්ෂා ඇති කරවන බව මගේ අදහසයි. එසේම එය නව පෙළඹවීමක් ඇති කරලීමට ද හේතු විය හැකි ය.

කිසියම් චිත්‍රපටයකින් පුවතක් ප්‍රචාරය වූ විට ඊට සමාන සිදුවීම් ඇතිවීමේ හැකියාවක් පවතී. එසේ වන්නේ ජන මනස තුළ එම සිදුවීම් විසින් ඇතිකරනු ලබන බලපෑම් වේ. නිදසුනක් ලෙස සියදිවි නසා ගැනීම් පිළිබඳ පුවත් පළවූ විට සමාජය තුළ ඒ ආකාරයේ සියදිවි නසා ගැනීම් වාර්තා වීම් වැඩි වීමේ ප්‍රවණතා ඇත. ඊට හේතුව එම සිදුවීම් ජන මනස තුළ බලපෑම් කිරීමයි. එවැනි දෑ පිළිබඳ සිදුකරන ලද සමාජ විද්‍යාත්මක පර්යේෂණ ද ඇත. සිනමාව ද එසේමය. බොහෝ දකුණු ඉන්දියානු දමිළ, මලයාලම් චිත්‍රපට නැරඹීමෙන් එම චිත්‍රපටවල දර්ශනය වන ආකාරයට ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන පිරිස් සමාජය තුළ මතුවීමේ අවස්ථා ඇත. සිනමාව මගින් චර්යාමය වෙනස්කම් වේගයෙන් සිදුවන අතර එය සමාජය තුළින් ද නිරීක්ෂණය වේ.

වෙබ් කතා මාලාවට අනුව කුඩා කණ්ඩායමක් ලෙස සංවිධානගත වන එම රාජි ඇතුළු පිරිස වරක් ලංකාවට ද බෝට්ටුවකින් සංක්‍රමණය වේ. එම සංක්‍රමණයේ සංවිධානාත්මක බව චිත්‍රපටයේ ඉතාම හොඳින් නිරූපනය කර ඇත. ඔවුන් එසේ ලංකාවට පැමිණෙන්නේ ලංකාවේ යම් තැනක රහසිගත ලෙස වළ දමා තිබෙන පුපුරණ ද්‍රව්‍ය ලබාගැනීම පිණිසය. ආයුධ වළ දමා ඇති ස්ථාන පිළිබඳ තොරතුරු තාක්ෂණික වශයෙන් ගබඩා කර ඇත. ඒවා නිශ්චිත ලෙස හඳුනා ගැනීමේ හැකියාව ඔවුන් සතුවේ. මෙයින් පෙන්වන්නේ සටනකට ඒකරාශී වන ඕනෑම මොහොතක භාවිතය සඳහා ආයුධ ක්‍රමවත්ව වළදමා ඇති බව ද? එනම් සන්නද්ධ අරගලයකට අවශ්‍ය වෙඩි බලය සැලසුම් සහගත ලෙස සහ ක්‍රමවත්ව ගබඩා වී ඇති බවේ සන්නිවේදනයක් ද? නැවත යුධ වැදීමේ අපේක්ෂාව ප්‍රේක්ෂක මනස තුළ ඇතිකිරීමට මෙම දර්ශන ඉතාම ප්‍රබලව සකස් වී ඇත. ඊට දෙබස්, සංගීතය, කැමරාකරණය සහ රංගනය සියුම්ව යොදාගෙන ඇත. නැවත යුද්ධයකට හෝ විනාශකාරී අරමුණකට පෙළගැසෙන විට ඇතිවන එක් ගැටළුවක් නම් ආයුධ සම්පාදනයයි. එවැන්නකට නිෂ්ක්‍රිය ප්‍රජාව සිත කරදර කරගත යුතු නැති බවත් ඊට අවශ්‍ය පසුබිම සකසා ඇති බවට පණිවිඩයක් මෙම දර්ශන හරහා නිකුත් කරයි ද? යන්න සිතිය හැකි ය.

යුද්ධයකින් පසුව ඇතිවන සමාජීය තත්වය රජයක් විසින් මනා ලෙස කළමනාකරණය කළ යුතු ය. එය යුද්ධ කිරීම මෙන්ම අසීරු කාර්යයකි. සමාජය තුළ යුධ පුහුණුව සහිත යම් දැක්මක් සහ ඉලක්කයක් වෙනුවෙන් මනස සැකසුණ කණ්ඩායමක් නිෂ්ක්‍රියව සිටියි. බොහෝවිට ජීවිතයෙන් වැඩි කාලයක් ආයුධයක් සමග යුධ මානසිකත්වයකින් ඔවුන් කටයුතු කර ඇත.

ඔවුහු මේ වන විට පුනරුත්ථාපනය වී විවිධ කර්මාන්තවල නිරතව ජීවත් වෙති. මෙම කථාවට අනුව එම අරමුණ සහිතව ජීවත්වන වැසියන් සහිත ගම්මානයක් ක්ෂණිකවම ආයුධ සන්නද්ධ වී ඉන්දියානු පොලිසියකට පහරදෙයි. නිෂ්ක්‍රිය පිරිස ඇතිකරන ක්ෂණික පහරදීම පොලිසියට පාලනය කරගැනීමට නොහැකි වේ. එවන් සිදුවීමක් ඕනෑම මොහොතක ලංකාවේ ද ඇතිවිය හැකි බවට සන්දේශයක් චිත්‍රපටය තුළින් පෙන්වනවා ද යන ගැටලුව චිත්‍රපටය නරඹන්නෙකුට ඇතිවිය හැකි ය.

එසේම චිත්‍රපටයක් තුළින් ජන සමාජයකට එවන් පණිවිඩයක් ලබාදේ ද යන්න ද සිතිය හැකි ය. සිනමාව සතුවන ජනමත සැකසීමේ ගුණය මෙවැනි තත්වයක දී බලපෑ හැකි ය. අතීතයේ රණකාමී මානසිකත්වය සහ අවශ්‍ය ජවය සකස් කරගැනීමට රණ ගීත සහය විය. චිත්‍රපට ඊට වඩා දායකත්වයක් දක්වයි. මෙම ටෙලිකතාවේ වීරයා ශ්‍රී කාන්ත් (මනෝජ් බජ්පායි) ඔහු බුද්ධි අංශ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. කතාවට අනුව බුද්ධි අංශයෙන් ඉවත්වී තොරතුරු තාක්ෂණ අංශයේ

රැකියාවක් කරන ඔහු එම රැකියාවේ නීරස බවත් තවත් පාරසරික කරුණු රාශියකුත් හේතුවෙන් නැවත බුද්ධි අංශයට එකතුවෙයි. එම එකතුවීම කතාවට නව පණක් ලබා දේ. JK නමැති ඔහුගේ සහයකයා චිත්‍රපටයට අවශ්‍ය විනෝදය සපයයි. එසේම ෂර්ලොක් හෝම්ස් කතාමාලාවේ ෂර්ලොක් ගේ සහයක වූ ඩොක්ටර් වොට්සන්ගේ චරිතයට සමාන තත්වයක් එම සහයකයා තුළින් ගැබ්වේ.


මනෝජ් බජ්පායි ගේ රංගනය මෙම චිත්‍රපටය තුළ විශිෂ්ට ලෙස නිරූපිතය. ශ්‍රී කාන්ත් මෙම මරාගෙන මැරෙන ඝාතකයා වූ රාජි පසුපස හඹා යයි. එම මෙහෙයුම අඩපණ කිරීම වෙනුවෙන් ඔහුගේ දියණියව ද පැහැරගනියි. ඔහු දියණියව ඉන් මුදවා ගනියි. මෙහෙයුමට අනුව රාජි ගේ ඉලක්කය පුපුරන ද්‍රව්‍ය පුරවන ලද සැහැල්ලු ගුවන්යානයක් රේඩාර්වලට හසු නොවන ලෙස ධාවනය කර ඉන්දියානු අග්‍රාමාත්‍යවරිය සහ ලංකාවේ රාජ්‍යතාන්ත්‍රිකයෙකුගේ හමුවීම සිදුවන ස්ථානය පුපුරුවාලීමයි. මෙම මරාගෙන මැරෙන අරමුණ වෙනුවෙන් ඇගේ මනස අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සකස් වී ඇත. ඊට බලපෑ කරුණු එකිනෙක චිත්‍රපටය තුළ පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ හමුදාවට චෝදනා එල්ලවන යුධ අපරාධ පිළිබඳ කරුණු ද චිත්‍රපටය තුළ ප්‍රකාශ කරයි. මේ සියල්ල එකතු වන්නේ නැවත සංවිධානගතව සටන් වැදීමේ අරමුණ වෙතයි. මෙම චිත්‍රපටය නිදා සිටින කොටි නැගිටවීමට අවශ්‍ය ජවය සපයනවා විය හැකි ය. සිනමා කෘතියක් නිර්මාණය කිරීමේ දී එවැනි නිදහසක් අධ්‍යක්ෂවරයා සතු වේ. නමුත් එහි ඇතුලාන්තයේ ඇති කතාව චිත්‍රපටය නරඹන කොටි සාමාජිකයින්ට හෝ වෙනත් සංවිධානයන්ට බොහෝ සංදේශ ගෙන එයි. එම පණිවිඩ සහ ඇතිකරන හැඟීම් විනාශකාරී අරමුණකට ගෙන එන්නේ නම් එහි ගැටළුවක් ඇත. කොටි ත්‍රස්තවාදීන් සංවිධානගත වීමේ ගැටලුව ලංකාවට මෙන්ම ඉන්දියාවට ද බලපෑම් කරනු ඇත. ඊළම දිනාගැනීමෙන් පසුව ඔවුන් ඉන්දියාව වෙත ද හැරෙනු ඇත. ඉන්දියාවේ රාජ්‍ය නායකයෙකු පවා කොටි ත්‍රස්තවාදීන් අතින් ඝාතනය විය. එසේම ත්‍රස්තවාදීන් පෝෂණය වීම ද ඉන්දියාව තුළ සිදුවිය.

මෙම චිත්‍රපටය විශාල ප්‍රේක්ෂක ආකර්ෂණයක් දිනාගෙන තිබේ. IMDBහි ඉහල ශ්‍රේණිගත කිරීමක් ද ලබාගෙන ඇත. සිනමාරූපී නිර්මාණය ප්‍රේක්ෂකයින් ආකර්ෂණය කරගැනීමට සියලු දායකත්වයන් නොමඳව ලබාදෙයි. කථාමාලාවේ අන්තර්ගතය ශ්‍රී ලංකාවට මොනතරම් අහිතකර වේ ද යන්න පිළිබඳ සංවාදයට භාජනය කළ යුතු මාතෘකාවකි. චින්තනමය අරගලයක් ගැටුමක් හෝ නැගී සිටීමක් කෙරෙහි මෙම චිත්‍රපටයේ අන්තර්ගතය කොයි තරම් දුරට බලපෑම් කරයි ද යන්න පිළිබඳ සාකච්ඡා කළ යුතුව ඇත. සිනමාව මගින් ජනමත සකස් කිරීම ඉතා පහසුවෙන් සිදුකළ හැකි ය. දකුණු ඉන්දියාවේ දමිළ සිනමාවේ දක්නට ලැබෙන කපා කොටා දැමීම පහරදීම් ආදී දර්ශන සහ චිත්‍රපට ආකෘතිය හේතුවෙන් ඒවා නරඹන්නන් එවැනි ක්‍රියාවන්වලට පහසුවෙන් යොමුවීම් දක්නට හැකිවිය. නිතර නරඹන චිත්‍රපට ශානරය නිරන්තරව පුද්ගල මනසටත් පසුව ඔහුගේ හැසිරීම් කෙරෙහිත් බලපෑම් කරයි. කෙසේ නමුත් මෙම වෙබ් කථා මාලාව සෑම මොහොතක්ම කුතුහලයෙන් පුරවමින් ප්‍රේක්ෂකයාව ඇද බැඳ තබාගැනීමට සමත් වෙයි. චිත්‍රපටයේ ආකෘතිය සහ ඒ ඒ මොහොතේ කුතුහලය පවත්වාගෙන යාම වෙනුවෙන් සිදුකර ඇති සිනමාත්මක දේ ප්‍රශංසනීය වේ.


මෙම චිත්‍රපටය පිළිබඳ ඉන්දියානු පුවත්පත් සහ වෙබ් අඩවිවල බොහෝ විචාර පළ වී තිබේ. ඒ බොහොමයක දක්වා ඇත්තේ වෙබ් කථා මාලාව ශ්‍රී ලාංකික දමිල ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේ සිත් පාරා ඇති බවයි. එසේම දමිල භාෂාව කතා කරන නළු නිලියන් පවා ඒවා උච්චාරණයේ යම් දෝෂ ඇති බව සඳහන් කර ඇත. එසේම සිංහල භාෂාවෙන් දෙබස් කියන නළු නිලියන් පවා ඒවා උච්චාරණය කරන අයුරින් ඔවුන් සිංහල ජාතිකයන් නොවන බව ඉතා හොඳින්ම ස්ඵුට වේ. දමිළ ජාතිකයෙකු/මුස්ලිම් ජාතිකයෙකු සිංහල උච්චාරණය කිරීමේ දී සහ සිංහල ජාතිකයෙකු දමිළ උච්චාරණය කිරීමේ දී දක්නට ලැබෙන වෙනසට සමාන වෙනසක් එහි දක්නට ඇත.

නමුත් මෙම චිත්‍රපටය නරඹන සිංහල නොවන ප්‍රේක්ෂාගාරයට සිංහල භාෂාවෙන් ඇති දෙබස් හුදු විදේශීය භාෂාවක දෙබස් ලෙස දැනෙන හෙයින් සිංහල නොවන පිරිසක් දෙබස් උච්චාරණය කරනු හැඟීමක් ඔවුන්ට නොදැනෙනු ඇත. එහෙයින් චිත්‍රපටයේ රස විඳීමට ඒවා බාධාවක් නොවේ. ශ්‍රී ලංකාවේ ප්‍රදේශ බව හඟවන පරිදි දර්ශන තල කිහිපයක්ම චිත්‍රපටයේ දක්නට ඇත. සිනමාවක් වශයෙන් මෙම නිර්මාණය රසවිඳීමට පුළුවන. කථාවේ අන්තර්ගතය සඳහා අධ්‍යක්ෂවරයාට පූර්ණ නිදහස ඇත. ඇතැම් විට මෙය සත්‍ය කතාවක් විය හැකි ය. එසේම සත්‍ය සිදුවීම් පාදක කරගත් නිර්මාණ සිනමාත්මකව වෙනස් කොට සකසන ලද කතාවක් විය හැකි ය. එසේ නොමැතිනම් සම්පූර්ණයෙන්ම මනඃකල්පිතයක් වන්නට පිළිවන. සිනමා කෘතියකින් ඇතිකරන ජනමත සැකසුම සහ බලපෑම තීව්‍ර වන්නේ එය සිනමා කෘතියක් ලෙස පමණක් ගෙන රසවිඳ සත්‍ය තත්ත්ව ලෙස ජීවිතයට නොගන්නා විටය. නමුත් සිනමාවක ඇති ඉහළ සන්නිවේදන ශක්‍යතාවන් එසේ වීමට ඉඩ නොදෙයි.



# කුස්සියේ ධනවාදය

## සමානුපාතිකව බෙදා වෙන් කිරීමේ ගණිත ගැටලුව



**ආචාර්ය ජයන්ත සේනාධීර**
ගණිත අංශය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අම්මා ගෙදර සෑදූ කජු අලුවා කැබලි පනහක් දරුවන් පස් දෙනාට බෙදා දීමට තීරණය කළාය. බොහෝ විට අම්මලා කරන පරිදි දරුවන් හැමෝටම සාධාරණ ලෙස එය බෙදීමට ඇයට අවශ්‍ය විය. ඒ ආකාරයට බෙදූ විට එක් අයෙකුට කජු අළුවා කැබලි 10 ක් ලැබෙන බව පැහැදිලි වේ.

නමුත් මෙවර ඇයට වැඩ කිරීමේ අගය සහ හොඳින් වැඩ කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව ළමයින්ට උගැන්වීමට උවමනා විය. ඇය දරුවන්ට පවසා සිටියේ සතිය තුළ එක් එක් දරුවා ඇයට උදව් කරනු ලබන කාලයේ ප්‍රමාණයට සමානුපාතිකව සති අන්තය වන විට කජු අලුවා කැබලි 50 බෙදා දෙන බවය. ඒ අනුව ඔබේ සහෝදරිය වැඩ කරන කාලය මෙන් දෙගුණයක කාලයක් වැඩ කරමින් ඔබ මවට උදව් වී නම් සහෝදරිය ලබන කජු අලුවා කැබලි ගණන මෙන් දෙගුණයක් ඔබට හිමිය. (සමානුපාතිකව බෙදීමේ දී අදාළ සාධාරණ ආකාරය එයයි) නිකම්ම නිකම් බෙදීමේ ගැටලුවක් සමානුපාතිකව බෙදා වෙන් කිරීමේ ගැටලුවක් බවට පත්වූයේ එසේයි. සතිය අවසාන වන විට එක් එක් දරුවා කුස්සියේ වැඩ කළ විනාඩි ගණන අම්මා කුස්සියේ ඇති පුවරුවක ලිව්වා ය.

| ළමයාගේ නම | පාලිකා | මාලිකා | ශාලිකා | නාලිකා | බාලිකා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| වැඩ කළ විනාඩි ගණන | 150 | 78 | 173 | 204 | 295 | 900 |

නියම කරන ලද නීතිය අනුව විනාඩි 900 න් විනාඩි 150 ක් වැඩ කළ පාලිකාට කජු අලුවා කැබලි 8 1/3 ක් ලැබිය යුතු ය. නමුත් අලුවා කැබලි කැඩීමට ගිය විට කුඩු වන බැවින් දිය හැක්කේ සම්පූර්ණ අලුවා කැබලි පමණි. පාලිකාට දිය හැක්කේ 8 ක්(හිමි ප්‍රමාණයට වඩා සුළු ප්‍රමාණයක් අඩුවෙන්) හෝ 9 කි. (හිමි ප්‍රමාණයට වඩා සුළු ප්‍රමාණයක් වැඩියෙන්) අනෙක් සෑම ළමයෙකුටම සිදු වන්නේත් මේ දේමය. මාලිකා ට ලැබිය යුතු නියම පංගුව වන්නේ කැබලි 4 1/3 කි. ශාලිකා ට 9 11/18 කි. නාලිකාට 11 1/3 කි. බාලිකා ට 16 7/18 කි. (මේ ගණන් හරි ද කියා නැවත විමසා බලන්න) මේ කිසිම වෙන් කිරීමක් ප්‍රායෝගික නොවන බැවින් අම්මා කුමක් කළ යුතු ද?

දැන් අපි අම්මා මුහුණ දුන් ගැටලුවේ සාරය රැගෙන වියුක්ත ආකාරයට ඉදිරිපත් කරමු.
ගැටලුව -
සමානුපාතිකව බෙදා වෙන් කිරීමේ ගැටලුවක, බෙදීම සඳහා කිසියම් දේවල් ප්‍රමාණයක් තිබිය යුතු ය (අම්මාගේ ගැටලුවේ දී, ඒවා කජු අලුවා වේ.) එමෙන්ම බෙදීම උදෙසා සමානුපාතිකත්ව දර්ශකයක් තිබිය යුතු ය. (අම්මාගේ ගැටලුවේ දී දර්ශකය සතියකට වැඩ කරන විනාඩි ගණන)


අපි ඒ සාකච්චා කරන ලද්දේ සමානුපාතිකව බෙදා වෙන්කිරීමේ ගණිත ගැටලුවකි. දැන් බැලූ බැල්මට මෙයට වෙනස් වූ තවත් සමානුපාතිකව බෙදා වෙන් කිරීමේ ගැටලුවක් සලකා බලමු.

### කැකිරි ලන්තයේ පාර්ලිමේන්තුව

කුස්සියේ කජු අලුවා බෙදීමේදී නම් අයෙකුට දෙන්නෙකුට වැඩි අඩු වීම් සිදුවීම, එතරම් ගැටලුවක් නොවේ. මවගේ විධායක බලයත් සමඟ කැරලිකරුවන් මෙල්ල වී යනු ඇත.

නමුත් කැකිරි ලන්තය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් නම් ජනගහනය අනුව මන්ත්‍රී ආසන බෙදා ගන්නා ආකාරය පිලිබඳ ක්‍රමවේදය අකුරටම තිතටම ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතු ය. කැකිරි ලන්තයේ ඇති ටිකිරි , මිහිරි, විසිරි, ගිගිරි සහ පිපිරි යන දිස්ත්‍රික්කවල ජනගහණයන් දහසේ ඒවායෙන් මෙසේ දැක්විය හැකිය.

| දිස්ත්‍රික්කය | ටිකිරි | මිහිරි | විසිරි | ගිගිරි | පිපිරි | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනගහණය (දහසේ ඒවායෙන්) | 150 | 78 | 173 | 204 | 295 | 900 |




අම්මාගේ ගැටලුව ජාත්‍යන්තර ගැටලුවක් බව දැන් ඔබට වැටහෙනවා ඇති . මෙන්න මේ ගැටලුව විධිමත්ව හැදෑරීම තමයි අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ. මේ ක්‍රමවත් හැදෑරීමට අපි ඊරොප්ප රාජ්‍යය යන මනඃකල්පිත රාජ්‍යයේ සැකැස්ම පිළිබඳව සලකා බලමු.

### ඊරොප්ප රාජ්‍යය

ඊරොප්ප රාජ්‍යය මැතිවරණ දිස්ත්‍රික්ක හයකින් සමන්විත වේ. ඒවා නම් අල පලාව, බල මුලාව, කල වෙලාව, ධන කලාව, එළු

රැලාව හා ෆාමර්ලාව යි. මේ මැතිවරණ දිස්ත්‍රික්ක පිළිවෙලින් ඉංග්‍රීසි හෝඩියේ A,B,C,D,E හා F යන අකුරුවලින් හඳුන්වමු. ඒ රොප්ප රාජ්‍යයේ ජනගහණය මැතිවරණ දිස්ත්‍රික්ක 6 අනුව බෙදී ඇත්තේ මෙසේය.

| දිස්ත්‍රික්කය | A | B | C | D | E | F | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනගහණය (දහසේ ඒවායෙන්) | 1646 | 6936 | 154 | 2091 | 685 | 988 | 12500 |

දැන් ප්‍රශ්නය වන්නේ ඒ රොප්පයේ A,B,C,D,E සහ F දිස්ත්‍රික්කවලට ඊරොප්ප පාර්ලිමේන්තුවේ ඇති මන්ත්‍රී ආසන 250 බෙදා දීමේ නීතිය ඊරොප්ප ජනරජයේ ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමයි. එක් එක් දිස්ත්‍රික්කවල ජන ගහනයට සමානුපාතිකව ආසන බෙදිය යුතු බවට හැමගේම ඒකමතික තීරණයක් ඇත. නමුත් එම ක්‍රියා පටිපාටිය කෙස් ගහටම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු ය. ඒ සඳහා උපකාරී වන තාක්ෂණික වචන කිහිපයක අර්ථ දැක්වීම් සහ පැහැදිලි කිරීම් පහත දැක්වේ.

## සම්මත භාජකය (standard divisor)

ආසනයක් සඳහා සාමාන්‍ය ජනගහනය සම්මත භාජකය ලෙස හැඳින්වේ. ඊරොප්පය සඳහා එය 12500000 ÷ 250 = 50000 වේ. (බොහෝ විට ඇත්ත සංඛ්‍යාවල දී මෙයට ලැබෙන්නේ විෂම භාගයකි)

## සම්මත කොටස (standard quota)

දිස්ත්‍රික්කයක ජනගහනය සම්මත භාජකයෙන් බෙදීමෙන් ලැබෙන අගය සම්මත කොටස ලෙස හැඳින්වේ. මෙය සාධාරණ කොටස ලෙස ද හැඳින් වේ. මෙම සම්මත කොටසින් දිස්ත්‍රික්කයට උරුම විය යුතු මන්ත්‍රී සංඛ්‍යාව ලැබේ. ප්‍රශ්නය වන්නේ එය බොහෝ විට පූර්ණ සංඛ්‍යාවක් නොවීමයි. උදාහරණ ලෙස A දිස්ත්‍රික්කයට උරුම සම්මත කොටස, එනම් ආසන සංඛ්‍යාව 1646000 ÷ 50000 = 32.92 වේ. නමුත් ආසන භාග ලෙස හෝ දශම ලෙස ලබාදිය නොහැක. එසේ නම් සම්මත කොටසේ ආසන්න පූර්ණ සංඛ්‍යාවට සමාන ආසන සංඛ්‍යාවක් එම දිස්ත්‍රික්කයට ලබාදීම සුදුසු නොවේ ද? ඔව් අපි එසේ සිතමු. දැන් අපි මුලින්ම ඊරොප්ප රාජ්‍යයේ එක් එක් දිස්ත්‍රික්කවලට හිමි සම්මත කොටස කුමක්දැයි සොයමු.

| දිස්ත්‍රික්කය | A | B | C | D | E | F | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනගහණය (දහසේ ඒවායෙන්) | 1646 | 6936 | 154 | 2091 | 685 | 988 | 12500 |
| සම්මත කොටස | 32.92 | 138.72 | 3.08 | 41.82 | 13.70 | 19.76 | 250 |

දැන් ඔබට පාසැලේ දී ඉගෙනගත් ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයීමේ පාඩම මතක ද? දශම කොටස 0.5 ට අඩු නම් එය පහළ පූර්ණ සංඛ්‍යාවට වටයයි. දශම කොටස 0.5 ට වැඩි හෝ සමාන නම් එය ඉහළ පූර්ණ සංඛ්‍යාවට වටයයි. මේ වටයීමට ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයීම යැයි කියනු ලැබේ. ඒ ආකාරයට වටයූ පසු ඊරොප්පයේ එක් එක් දිස්ත්‍රික්කවලට හිමි ආසන සංඛ්‍යාව කුමක්දැයි සොයා බලමු.

| දිස්ත්‍රික්කය | A | B | C | D | E | F | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජනගහණය (දහසේ ඒවායෙන්) | 1646 | 6936 | 154 | 2091 | 685 | 988 | 12500 |
| සම්මත කොටස | 33 | 139 | 3 | 42 | 14 | 20 | 251 |

සිදු වූයේ කුමක්ද ? දැන් අපිට පාර්ලිමේන්තුවේ ආසන සංඛ්‍යාව තවත් එකකින් වැඩි කළ යුතුව ඇත. එහෙත් පාර්ලිමේන්තුවේ ආසන සංඛ්‍යාව එසේ සිතූ සිතූ ආකාරයට වැඩි කළ නොහැකි බව ඔබ හොඳින් දනී. එසේ නම් සම්මත වටයීම මගින් ඒ රොප්ප පාර්ලිමේන්තුවේ ආසන බෙදා වෙන්කිරීමේ ගැටලුවට විසඳුමක් නොලැබේ.

දැන් අපි කුමක් කරමු ද? වඩා හොඳ බෙදා වෙන් කිරීමේ ක්‍රමයක් යෝජනා කළ යුතුව ඇත. එම ක්‍රමයේ දී කරුණු තුනක් සහතික විය යුතුව ඇත.

1. බෙදා වෙන් කෙරුණු පසු ආසනවල එකතුව 250 විය යුතු ය.
2. සෑම දිස්ත්‍රික්කයකටම සාධාරණ කොටසක් එනම් අඩුම ගණනේ දශම කොටස අතහැරිය විට ලැබෙන පූර්ණ සංඛ්‍යාව හෝ හිමි විය යුතු ය.
3. ඒ සඳහා පැහැදිලි ඇල්ගෝරිතමයක් පැවතිය යුතු ය.

ඉදිරි සාකච්ඡා මඟින් මේ යෝජනා වන එක් එක් ක්‍රම විග්‍රහ කරනු ඇත.

## හැමිල්ටන් ක්‍රමය

හොඳයි මෙහෙම හිතුවොත් මොකද? අර මීට පෙර බෙදා වෙන් කිරීමේ දී අප ගැටලුවකට මැදි වූයේ සම්මත වටයීමේ දී, දශම කොටස 0.5 ට වැඩි හෝ සමාන විට එය ඉහළ පූර්ණ සංඛ්‍යාවට වැටයීමට සිදුවීමයි. අපි මෙහෙම කරමු ද? භාග කොටස කුමක් වුවත් එය අමතක කර පහළ පූර්ණ සංඛ්‍යාව දිස්ත්‍රික්කයකට ලබා දෙමු. ඕනෑම දිස්ත්‍රික්කයකට සම්මත කොටසේ පහළින් ආසන්න පූර්ණ සංඛ්‍යාව සහතික වන බැවින් එය සාධාරණ ක්‍රමයකි. නමුත් දැන් මතුවන ගැටලුව කුමක් ද? ඔව් ඔබටත් හැඟෙන පරිදි මෙසේ කිරීමේ දී බෙදා දෙන ආසන සංඛ්‍යාවේ එකතුව 250 ට අඩුවීමේ අවස්ථා පැන නැඟිය හැකියි. හොඳයි එම ආසන සංඛ්‍යාව සම්පූර්ණ වන පරිදි ඉතිරි ආසන සංඛ්‍යාව

පිළිවෙලින් වැඩිම භාගය හිමි දිස්ත්‍රික්කවලට ලබාදීම අසාධාරණ ද? ඇත්තෙන්ම එහි අසාධාරණ බවක් නොපෙනේ. ඇමරිකානු ජාතික ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් විසින් ද යෝජනා කෙරුවේ ද මෙම ක්‍රමයයි. එය අපිට ඇල්ගෝරිතමයක් ලෙස මෙසේ ඉදිරිපත් කළ හැකි ය.

**පියවර 1** එක් එක් දිස්ත්‍රික්කයේ සම්මත කොටස ගණනය කරන්න.

**පියවර 2** එක් එක් දිස්ත්‍රික්කයට සම්මත කොටසේ පහළ පූර්ණ සංඛ්‍යාව ලබා දෙන්න.

**පියවර 3** දෙවෙනි පියවරේ දී ආසන සංඛ්‍යාව සම්පූර්ණ නොවූයේ නම් ආසන සංඛ්‍යාව සම්පූර්ණ වන තුරු පිළිවෙළින් වැඩිම ඉතිරි භාගය ඇති දිස්ත්‍රික්ක වලට ආසනය බැගින් ලබා දෙන්න.

ඇමරිකා එක්සත් ජනපදයේ 1850 සිට 1900 දක්වා භාවිත වූයේ මෙම ක්‍රමයයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ භාවිත වන්නේ ද මෙම ක්‍රමයයි.

දැන් අපි හැමිල්ටන් ක්‍රමය අනුව ඒ රොප්ප රාජ්‍යයේ දිස්ත්‍රික්ක අතර ආසන 250 බෙදා දෙමු.

| දිස්ත්‍රික්කය | A | B | C | D | E | F | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| සම්මත කොටස | 32.92 | 138.72 | 154 | 2091 | 685 | 988 | 12500 |
| පහළ පූර්ණ සංඛ්‍යාව | 32 | 138 | 3 | 41 | 13 | 19 | 246 |
| ඉතිරි කොටස | 0.92 | 0.72 | 0.08 | 0.82 | 0.7 | 0.76 | 4.00 |
| ඉතිරි කොටසේ පිළිවෙළ (ආසන හිමි) | පළමු | සිව්වන | | දෙවන | | තෙවන | |
| බෙදා වෙන් කිරීම | 33 | 139 | 3 | 42 | 13 | 20 | 250 |

දැන් ඉතින් සියල්ලන්ටම සතුටින් විසිර යා හැකි ද? සියල්ලන්ටම සාධාරණය ඉටුවේවි ද? ඇමරිකා එක්සත් ජනපදය වර්ෂ 1900 දී මෙම ක්‍රමය අතහැර දැම්මේ මන් ද? මෙයට වඩා සාධාරණ ක්‍රම නැද්ද? මේ සියල්ලන්ටම පිළිතුරු ඉදිරි කලාපයකින් බලාපොරොත්තු වන්න.


ආශ්‍රිත ග්‍රන්ථ

- Excursions of Modern Mathematics, Peter Tannenbaum, 2009


04 වන පිටුවෙන්...

### "අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම

2022 ඡන්දහිමි නාමලේඛනය සඳහා ඇතුළත් වීමට(අ) හා ඉවත්වීමට (ආ) නිර්දේශ කරන ලද නම් ලැයිස්තු 2022.06.01 දින සිට 2022.06.28 දින දක්වා ග්‍රාම නිලධාරී කාර්යාලවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරනු ලබයි. (මෙම කාලසීමාවන් පාලනය කළ නොහැකි හේතූන් මත වෙනස්වීමට ද ඉඩ ඇත)

### හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම

2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිවීමට සුදුසුකම් සපුරා තිබෙන එහෙත් ඒ සඳහා නිර්දේශ වී නොමැති පුද්ගලයින්ට හිමිකම් ඉල්ලීම සඳහා ඉහත කී 2022.06.01 සිට 2022.06.28 කාලසීමාව තුළ දී දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වේ.

එසේම සුදුසුකම් නොමැති තැනැත්තෙකුගේ නම නිර්දේශ වී ඇත්නම් ඒ සඳහා ද විරෝධතාවක් නියමිත ආකෘතියෙන් දෙපිටපතකින් යුතුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත මෙම කාලය තුළ ඉදිරිපත් කළ හැකි ය.

ඒ අනුව මෙම සියලුම ව්‍යවස්ථාපිත කාර්යයන් අවසානයේ දී 2022 ඡන්දහිමි නාමලේඛනය 2022 වර්ෂය නිමවීමට පෙර සහතික කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු සම්පාදනය කර ඇත.


### 18 සම්පූර්ණ කළ විගස ඡන්ද බලය ලබා දීම.

වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්දහිමි නාමලේඛන මඟින් ඡන්ද බලය ලබාදීම සඳහා නීති සම්පාදනය කර ඇත. ඒ අනුව පෙබරවාරි 01 සිට මැයි 31 දක්වා; ජූනි 01 සිට සැප්තැම්බර් 30 දක්වා; ඔක්තෝබර් 01 සිට ජනවාරි 31 දක්වා යන කාල පරිච්ඡේද තුළ වයස අවුරුදු 18 සම්පූර්ණ කරන තැනැත්තන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛන සෑම මාස 04කට වරක්ම මින් ඉදිරියට සකස් කෙරේ.

ඒ අනුව 2022.02.01 සිට 2024.01.31 දක්වා (වසර දෙකක කාලය සඳහා) වයස අවුරුදු 18 සම්පූර්ණ කරන යොවුන් පුරවැසියන් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා තොරතුරු එක්රැස් කරනු ලැබේ. 2004.02.01 දින සිට 2006.01.31 දක්වා උපන් තැනැත්තෙකු නම් (අවුරුදු 16 - 18 දක්වා වූ තැනැත්තාගේ විස්තර YC/2022 ආකෘතියට ඇතුළත් කර ජාතික හැඳුනුම්පතෙහි හෝ (නැතහොත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපියේ) පිටපතක් හෝ උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ සමඟ ග්‍රාම නිලධාරී වෙත ලබාදීමට කටයුතු කරන්න. ඒ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර YC/2022 ආකෘතියෙහි සඳහන් වේ. මෙම ආකෘතිය අදාළ ග්‍රාම නිලධාරී, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබා ගත හැකි අතර එයට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් (www.elections.gov.lk) ද බාගත කරගත හැකි වේ.



2022 නව වසරේ රාජකාරි කටයුතු ආරම්භ කිරීමේ අවස්ථාව



ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති 2022.01.24 වන දින මැතිවරණ කොමිෂන් සභාව හමු වූ අවස්ථාව



ග්‍රාම නිලධාරී සංගම්වල නියෝජිතයන් සමඟ 2022.01.25 දින පැවැත් වූ සාකච්ඡාව



දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2022.02.23 දින පැවැත් වූ සාකච්ඡාව



ශ්‍රී ලංකාවේ නවසීලන්ත තානාපති 2022.03.08 වන දින මැතිවරණ කොමිෂන් සභාව හමු වූ අවස්ථාව



මැතිවරණ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පුහුණු වැඩසටහන් සඳහා අත්‍යාවශ්‍යව පැවති ජංගම පුහුණු ඒකකයක් IFES (International Foundation for Electoral Systems) ආයතනය විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත 2022.03.08 දින පිරිනමන ලදී.


**උපදේශක මණ්ඩලය**
නීතිඥ නිමල් ජී. පුංචිහේවා - සභාපති
එස්. බී. දිවාරත්න - සමාජික
කේ.පී.පී. පතිරණ - සමාජික
එම්.එම් මොහොමඩ් - සමාජික
පී.එස්.එම්.චාල්ස් - සමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
**සංස්කාරක** - චන්න පී. ද සිල්වා (අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
**පරිගණක පිටු සැකසුම** - අමිල ගමගේ
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - පර්යේෂණ හා සැලසුම් අංශය
මැතිවරණ කොමිෂන් සභාව



**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**
සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl
Election Commission of Sri Lanka
Election Commission of Sri Lanka



ISSN-2706-0047





මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ප්‍රකාශ නොවේ.



රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව